**විද්‍යා හා තාක්ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය - 2023**

---

විද්‍යා හා තාක්‍ෂණ මානව සම්පත් සංවර්ධන ව්‍යාපෘතියේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2019 ජනවාරි 17 දින එළඹි අංක 3698 එස්ආර්අයි හා 3699 එස්ආර්අයි (සීඕඑල්) ණය ගිවිසුම්වල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්‍ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර කැලණිය, රජරට, සබරගමුව සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. රටේ උසස් අධ්‍යාපන පද්ධතියට රැකියාභිමුඛ තාක්‍ෂණික උපාධි වැඩසටහන් ඇතුළත් කිරීමේ ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ මුල් ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 26,400කට සමාන එ.ජ.ඩො මිලියන 165ක් වූ අතර ඉන් රු.මිලියන 23,200කට සමාන එ.ජ.ඩො මිලියන 145ක් මූල්‍යනය කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ශ්‍රී ලංකා රජය විසින් ඉතිරි මුදල වන රු. මිලියන 3,200 කට සමාන එ.ජ. ඩොලර් මිලියන 20 ක් මූල්‍යකරණය කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 අප්‍රේල් 17 දින පසුගාමී මූල්‍යනය යටතේ ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කරන දිනය 2024 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර ඇත.

## 1.3 මතය

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන මඟින් 2023 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, 2023 වර්ෂය සඳහා වූ වියදම් ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්වලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූල වන පරිදි විගණනය සිදු කරන ලදි.මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශවය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට,ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ.ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර,දූස්සන්ධානය,ව්‍යාජ ලේඛණ සැකසීම,චේතනාන්විත මඟ හැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කල අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයා ගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ල 2023 ජූලි 22 වන දින අවසන් කිරීමට නියමිතව තිබූ අතර එය 2024 ඔක්තෝබර් 31 දක්වා දීර්ඝ කර ඇත. කොන්ත්‍රාත්තුවේ ප්‍රගති වාර්තාවලට අනුව, ආරම්භ වූ දින සිට වසර 3ක් ගතවීමෙන් පසු එනම් 2024 ජනවාරි 31 වන විට භෞතික ප්‍රගතියෙන් සියයට | COVID-19 වසංගතය, අස්ථාවර සාර්ව ආර්ථික පරිසරය, විදේශ මුදල් උච්චාවචනයන්, උද්ධමනය, ආනයන සීමා කිරීම් සහ ඉන්ධන සැපයුම් සීමාවන් හේතූන් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට දැඩි ලෙස බලපෑවේය. මෙම කාලය තුළ බොහෝ කොන්ත්‍රාත්කරුවන් මුදල් ප්‍රවාහ ගැටළු වලට මුහුණ දුන් බව. | කොන්ත්‍රාත්තුවේ වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

36ක් පමණක් ලබාකර ගෙන තිබුණි. එබැවින් සැලකිය යුතු ඉතිරි වැඩ ප්‍රමාණයක් නියෝජනය වන සියයට 64 ක ප්‍රමාණය ඉතිරි කොන්ත්‍රාත්තු කාලය වන මාස නවයක් ඇතුළත නිම කළ යුතුය.

## 2.2 ඌන උපයෝජිත සම්පත්

| අංකය | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතිය 2023 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ණය දීමේ නියෝජිතායතනය විසින් ප්‍රතිපාදනය කරන ලද ඇ.ඩොලර් මිලියන 145කින් නියෝජනය වන සියයට 87.9න් ව්‍යාපෘතිය ආරම්භ කළ දින සිට 2023 දෙසැම්බර් 31ට වසර 05 මාස 8ක් ගත වී තිබුණද ඇ.ඩොලර් මිලියන 72.89කින් නියෝජනය වන සියයට 50.26ක් පමණක් භාවිත කර තිබුණි. 2023 දෙසැම්බර් 31 දිනට භාවිතයට නොගත් ණය ශේෂය සඳහා රු. මිලියන 176කට සමාන ඇමෙරිකානු ඩොලර් 795,741 ක කැපවීම් ගාස්තු ගෙවා තිබුණි. එබැවින්, ඇ.ඩො. මිලියන 72.11 ක ණය ශේෂය නියෝජනය වන සියයට 49.73 භාවිතා කිරීම සහ ඉතිරි මාස 18 ක ව්‍යාපෘති කාල සීමාව ඇතුළත ව්‍යාපෘතිය අවසන් කිරීමේ හැකියාව පිළිබඳ විගණනයේදී සැක සහිත විය. | ඉදිකිරීම් කටයුතු, භාණ්ඩ සහ අනෙකුත් වියදම් සඳහා ඇ.ඩොලර් මිලියන 129.7 කින් සහ ණය පොලී සහ කැපවීමේ ගාස්තු සඳහා ඩොලර් මිලියන 15.3 කින් ණය අරමුදල සමන්විත වේ. වෙන් කරන ලද ණය අරමුදල් ප්‍රදානය කිරීමේ රු. මිලියන 129.7 කින් රු. මිලියන 97.22 ක් වටිනාකමැති කොන්ත්‍රාත්තු සම්පූර්ණ කර ඇති අතර ඉතිරි ප්‍රදානය ව්‍යාපෘති කාල සීමාව තුළ (2024 දෙසැම්බර් 31) සම්පූර්ණ කළ හැකි අතර 2025 ජූනි 30 වැනි දින ණය අවසන් වන තෙක් විසර්ජන ලබා දීම සම්පූර්ණ කළ හැක. එබැවින්, සම්පූර්ණ ව්‍යාපෘති අරමුදල 2025 ජූනි 30 වන විට භාවිතා කළ හැකි බව. | කොන්ත්‍රාත්තුවේ වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි.. |
| (ආ) | 2020 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට රු. මිලියන 17ක වියදමින් පුස්තකාල පොත් 1,098ක් මිලදී ගෙන තිබුණි. ඉන් පොත් 1,095ක් මිලදී ගත් දින සිට 2023 නොවැම්බර් 30 දක්වා පාඨකයන්ට නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයට (IESL) අනුව වොෂින්ටන් ගිවිසුම ලබා ගැනීම සඳහා නිර්දේශිත පොත්වල භෞතික පිටපත් අත්‍යවශ්‍ය වේ. COVID-19 වසංගතය හේතුවෙන්, සිසුන් අන්තර්ජාලය හරහා ඉගැන්වීමේ ක්‍රම අනුගමනය කළ අතර, එය පශ්චාත් වසංගතයෙන් පවා දිගටම පැවතුණි. මත්තේගොඩ ඉංජිනේරු පීය ගොඩනැගිලි නිමවීමත් සමඟ එක් කණ්ඩායමකට සිසුන් බඳවා ගැනීම 400 දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන බව. ඒ අනුව ඔවුන්ගේ පරිහරණය සඳහා පොත් මිලදී ගෙන ඇති බව. | අක්‍රියව තබා නොගෙන ව්‍යාපෘති සම්පත් ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |

**2.3 මතභේදාත්මක ස්වරූපයේ කරුණු**

| අංකය | විගණන ගැටලු | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- |
| (අ) | 2023 අධ්‍යයන වර්ෂයේ සිට ඉංජිනේරු පීඨයට සිසුන් බඳවා ගැනීම 120 සිට 400 දක්වා වැඩි කිරීම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ඉදිකිරීමේ ප්‍රධාන අරමුණ විය. කෙසේ වෙතත්, ව්‍යාපෘතිය යටතේ ඉංජිනේරු පීඨය අවසන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් මේ වන විට සිසුන් 180දෙනෙකු බඳවා ගැනීමට සිදු කර තිබුණි. ඊට අමතරව  අමතරව ඉංජිනේරු පීඨය පවත්වාගෙන යාම සඳහා කුලියට ගත් ගොඩනැගිල්ල සඳහා කුලී ගාස්තු ලෙස රු. මිලියන 19ක්  2023 ජූලි සහ 2024 පෙබරවාරි අතර ප්‍රමාද වූ කාලය වෙනුවෙන් විශ්වවිද්‍යාලයට දැරීමට සිදුවී තිබුණි. | සේවා යෝජකයන්ගේ අවශ්‍යතා (ER) හි සඳහන් පරිදි සිසුන් බඳවා ගැනීම ක්‍රමයෙන් වැඩි කරමින් පවතී. කෙසේ වෙතත්, දැනට පවතින උපරිම ධාරිතාව ප්‍රයෝජනයට ගනිමින් අතිරේක යටිතල පහසුකම් හෝ මානව සම්පත් නොමැතිව පසුගිය වසර කිහිපය තුළ බඳවා ගැනීම 120 සිට 180 දක්වා දැනටමත් වැඩි කර  ඇත. සේවක සංඛ්‍යාව වෙන් කිරීම සහ රසායනාගාර අවකාශයන් වැනි අමතර සම්පත් නොමැතිව තවදුරටත් වැඩිකිරීම් කළ නොහැකි බව. | කොන්ත්‍රාත්තුවේ වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | මෙම ව්‍යාපෘතිය මගින් 2021 වසරේ තාක්ෂණ පීඨය සඳහා පුස්තකාල පොත් මිලදී ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූල නොවී පූර්ව අත්දැකීම් නොමැති සැපයුම්කරුවෙකු තෝරාගෙන පොත් වර්ග 118කට අයත් ඒකක 421ක් එනම් මුළු ප්‍රසම්පාදනයෙන් සියයට 76ක්  හෙවත් රු. මිලියන 20කට මිලදී ගෙන තිබුණි. ඉන් රු.මිලියන 7.6ක් වටිනා පොත් වර්ග 33කට අයත් ඒකක  114ක් පෙර පරිහරණය කළ පොත් (used book) විය.  එමෙන්ම, රු.මිලියන 7ක් වැයකර විෂයය නිර්දේශවලට අදාළ නොවූ පොත් වර්ග 69කින් ඒකක 179ක් මිලදී ගෙන තිබුණි. මෙම ප්‍රසම්පාදනයේදී, අන්තර්ජාතික වෙළඳපොළ තුළ පැරණි හා නව පොත් අලෙවිවන අවම මිල ගණන් වලට සාපේක්ෂව පොත් වර්ග 63කින් ඒකක 227ක් වැඩි මිලකට මිලදී ගැනීම නිසා රු. මිලියන 12ක මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි. | මෙම ගැටලුව සම්බන්ධයෙන් සබරගමුව විශ්වවිද්‍යාලය මූලික පරීක්ෂණයක් පවත්වා විශ්වවිද්‍යාල පාලක සභාවට සහ රජයේ විගණකවරයාට වාර්තා කර ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කෝප් කමිටුවේ උපදෙස් අනුව කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුව 2024 ජූනි 11 වැනි දින විශ්වවිද්‍යාලයට පැමිණ විමර්ශනය කරන ලද බව. | විමර්ශනය කඩිනම් කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් මූල්‍ය අලාභය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2023 දෙසැම්බර් 31 දින ව්‍යාපෘතිය නිම කිරීමට නියමිත දිනය වුවද එය 2024 දෙසැම්බර් 31 දක්වා දින දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය වෛද්‍ය පීඨය සඳහා රසායනාගාර ගොඩනැගිලි සංකීර්ණය සහ උපකරණ ඉදිකිරීමේ ව්‍යාපෘතිය විෂය පථයට අලුතින් එක් කර ඇති අතර එය 2025 අප්‍රේල් 23 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. එබැවින්, ඉහත සඳහන් නව විෂය පථයේ කාලසීමාව 2024 දෙසැම්බර් 31 වන දින ව්‍යාපෘති අවසන් කිරීමේ දිනයෙන් ඔබ්බට ගොස් තිබුණි. | මොරටුව වෛද්‍ය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා රසායනාගාර ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේ සහ උපකරණ මිලදී ගැනීම ව්‍යාපෘති විෂය පථයට අලුතින් එක් කර ඇති අතර කොන්ත්‍රාත්තුව 2024 අප්‍රේල් 24 දින ප්‍රදානය කරන ලදී. කොන්ත්‍රාත් කාලය වසරක් වන අතර, ව්‍යාපෘතිය නිම කිරීමට කොන්ත්‍රාත්කරුට වසරක කාලයක් ලබා දිය යුතුය. 2024 දෙසැම්බර් 31 වැනි දින ව්‍යාපෘති අවසන් දිනය දක්වා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ හැකි අතර, 2025 ජූනි 30 වැනි දින ණය අවසන් දිනය දක්වා මුදල් ලබා දීම සිදු කළ හැක. එබැවින්, නියමිත දින දක්වා ඉදිකිරීම් කටයුතු කරගෙන යාමේ ගැටලුවක් ඇති නොවන බව. | කොන්ත්‍රාත්තුවේ වැඩ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |